සැ. යු. - 2024.07.26 දින පළ වූ අංක 2395 *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,396 - 2024 අගෝස්තු මස 02 වැනි සිකුරාදා - 2024.08.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 258 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | 262 |
| විවිධ දැන්වීම් ... ... ... ... | 273 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීත් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මීත් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2024 අගෝස්තු මස 23 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 අගෝස්තු මස 09 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

**කොළඹ දිසා අධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

කොළඹ දිසා අධිකරණයේ
නඩු අංකය : DMB 358/19
කඩුවෙල දිසා අධිකරණයේ
ඇස්කීසි අංකය : 54/2022

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී,
අංක 1161, මරදාන පාර,
කොළඹ 08.

*...............පැමිණිලිකරු.*

*- එදිරිව -*

උඩුවරගේ රජිත කුමාරසිරි පෙරේරා,
අංක 336/බී, පහල බෝමිරිය, කඩුවෙල.

*................විත්තිකරු.*

කඩුවෙල, පහල බෝමිරිය, අංක 336/බී හි පදිංචි උඩුවරගේ රජිත කුමාරසිරි පෙරේරා යන අය වෙතටයි.

වර්ෂ 2020 ක් වූ සැප්තැම්බර් මස 23 වැනි දින ඉහත අංක දරන නඩුවේ සමථ තීන්දු ප්‍රකාශය ප්‍රකාර,

පළමු නඩු නිමිත්ත යටතේ වර්ෂ 2019.04.30 වැනි දිනට එවකට ගෙවා ඇති මුදල අඩු කිරීමෙන් පසුව රුපියල් හැත්තෑනව ලක්ෂ හැත්තෑ හතර දහස් තුන්සිය හතළිහයි ශත හයක (රු. 7,974,340.06) මුදලක් සහ එකී මුදල මත වර්ෂ 2019.05.01 වැනි දින සිට පැමිණිල්ලේ දින (එනම් 2019.09.24) දක්වා මසකට 4% බැගින් පොළියක් ද ඉන්පසු පැමිණිල්ලේ දින (එනම් 2019.09.24) සිට එකී සම්පූර්ණ මුදල මත එකී සම්පූර්ණ මුදල් ගෙවා නිම කරන දින දක්වා නෛතික පොළිය ද නඩු ගාස්තු ද ගෙවීමට අණකොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

අධිකරණයේ නිලධාරියෙකු විසින් තක්සේරු කරනු ලබන නඩු ගාස්තු ද විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවට අණකොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

තව ද, එකී නඩුවේ තීන්දු ප්‍රකාශය ඉටු කිරීමට එකී විත්තිකරු අපොහොසත් වී/පැහැර හැර ඇති හෙයින්, එකී නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති ඇස්කීසියේ බලය පිට ඉහත නම සඳහන් විත්තිකරුවන උඩුවරගේ රජිත කුමාරසිරි පෙරේරා යන අයට අයත් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළෙ හි හිමිකම්, අයිතිවාසිකම් හා ඊට අදාළ සෑම සියලු දේ, කොළඹ දිසා අධිකරණයෙන් මා වෙත නිකුත් කරන ලද ඇස්කීසිය මත කඩුවෙල දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් වන මා විසින් වර්ෂ 2022 ක් වූ නොවැම්බර් මස 08 වැනි දින, නිසිලෙස තහනම් කරන ලද පහත උපලේඛනයේ සඳහන් දේපළ,

**වර්ෂ 2024 ක් වූ අගෝස්තු මස 29 වැනි දින පෙරවරු 11.00 ට,**

එකී දේපළ පිහිටා ඇති බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 474 ඒ රග්ගහවත්ත ග්‍රාම නිලධාරී වසමේ හේවාගම ග්‍රාමයෙ හි පිහිටි ''කෝන්ගහවත්ත'' නම් ඉඩමෙහි ම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*දේපළට පිවිසෙන මාර්ගය.-*

කොළඹ සිට හංවැල්ල මාර්ගය ඔස්සේ සැතපුම් 09 ක් පමණ ගොස් කඩුවෙල හංදියට සැතපුම් 01 කට පමණ පෙර දකුණු පසට හැරී රාමහැර පාර ඔස්සේ සැතපුම් 3/4 ක් පමණ ගමන් කරන විට මෙම ඉඩම හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම් ගැණුම්කරු විසින් මා වෙත ගෙවිය යුතුය.

සියලුම ගෙවීම් මුදලින් පමණක් කල යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. සම්පූර්ණ ගැණුම් මුදලෙන් 25% ක මුදලක්. ඉතිරි 75% ක මුදල වෙන්දේසි දින සිට දින තිහක් (30) ඇතුළත ඉහත අංක දරන නඩුවට අධිකරණයේ තැන්පත් කළ යුතු ය.

2. පිස්කල් ගාස්තු/වෙන්දේසි ගාස්තු සහ රජයේ ගාස්තු,

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 474 ඒ රග්ගහවත්ත ග්‍රාම නිලධාරි වසමේ හේවාගම ග්‍රාමයෙ හි පිහිටි ''කෝන්ගහවත්ත'' නම් ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. හෙට්ටිගේ මහතා විසින් 2002.08.18 දින (බලයලත් මිනින්දෝරු ඒ. හෙට්ටිගේ මහතා විසින් 2002.07.06 හා පිඹුරු අංක 3384 හි ලොට් 01 ලෙස නැවත මැන හා කොටස් කරන ලද) මැන සාදන ලද අංක 3396 දරන පිඹුරේ ලොට් 10 ලෙස ලකුණු කරන ලද ඉඩම් කැබැල්ල සඳහා මායිම්.

උතුරට : අංක 3396 පිඹුරේ ලොට් 11 ද, නැගෙනහිරට : පාර සහ අංක 3396 පිඹුරේ ලොට් 26 ද, දකුණට : අංක 3396 පිඹුරේ ලොට් 26 සහ ලොට් 9 ද, බටහිරට : අංක 3396 පිඹුරේ ලොට් 9 සහ ලොට් 22 ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දහයයි, දශම දෙකයි පහක් (පර්. 10.25) ක් හෝ හෙක්ටයාර 0.0259 ක් වන බිම් ප්‍රමාණය සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගස්, වගාවන්, ආදී සියලුම දේත් සමග වේ. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක B623/90 දරන වෙලුමේ සහ පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

මේ සමග බලයලත් මිනින්දෝරු ඒ. හෙට්ටිගේ මහතාගේ 2002.08.18 දින 3396 දරන පිඹුරේ ලොට් 26 දරන මාර්ග අයිතිය සමග වේ.

බී. ජේ. ගිලානි ද සිල්වා,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
කඩුවෙල.

2024 ක් වූ ජූනි මස 24 වැනි දින දී ය.

08-24

---

**හොරණ දිසා අධිකරණයේ දී ය**

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 255 වන වගන්තියට අනුව පිස්කල් විසින් කරනු ලබන පිස්කල් විකිණීම

සෙලාන් බැන්ක් පීඑල්සී,
(කලින් සෙලාන් බැන්ක් ලිමිටඩ් යනුවෙන් හඳුන්වන ලද)
සෙලාන් ටවර්ස්, අංක 90, ගාලු පාර, කොළඹ 03.

නඩු අංකය : 7757/MB
ස්වභාවය : උකස්
වටිනාකම : රු. 1,701,000/-
ඇසිකිසි අංකය :

*...............පැමිණිලිකරු.*

*එදිරිව*

1. පොතුපිටියගේ මනෝජ් ප්‍රියංකර
2. ඔස්කා විරාජ් විජිතමාල් පොතුපිටිය
   අංක 269 A3, "නුවන්පාය", ඔකන්දුව, බණ්ඩාරගම.

*..............විත්තිකරුවන්.*

ඉහත අංක දරන නඩුවේ 2015.02.25 වැනි දින ඇතුළත් කරන ලද නඩු තීන්දුව අනුව පැමිණිලිකාර බැංකුවට අය විය යුතු රු. 1,700,719.58 මුදල සහ වර්ෂ 2013.11.01 දින සිට එකී මුදල පැමිණිලිකරු වෙත සම්පූර්ණයෙන් ගෙවා නිමකරන තෙක් රු. 1,000,000/- මුදල මත වාර්ෂික 22% බැගින් වන පොළිය ද, නඩු ගාස්තු ද ගෙවිය යුතු බවට නියෝග කොට ඇති හෙයින් ද, ඒ අනුව ඉහත නම සඳහන් විත්තිකරුවන්ට අයත් දැනටමත් තහනමට ගෙන ඇති පහත උපලේඛනයේ සඳහන්වන දේපළ පිස්කල් වෙන්දේසියේ විකුණා පැමිණිලිකාර බැංකුවට අයකර දීම සඳහා,

**වර්ෂ 2024 ක් වූ සැප්තැම්බර් මස 04 වැනි දින පෙ. ව. 11.00 ට,**

එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, මදුරාවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 648 මදුරාවල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, රයිගම් කෝරළේ මුංවත්තේබාගේ පත්තුවේ, උඃරතුඩාවේ පිහිටි බටදොඹගහවත්ත උතුරු කොටස නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. අදිකාරම් විසින් වර්ෂ 1996.10.30 දින මැන සාදන ලද අංක 920 දරන පිඹුරේ ලොට් අංක 1න් නිරූපිත ඉඩම් කැබැල්ල සහ එහි පස, ගස්, වගා, ගොඩනැගිලි සහ ඒ මත ඇති සියලු දේ සහ එකී ඉඩම සඳහා මායිම් :

| | | |
|---|---|---|
| උතුරට | : | බලයලත් මිනින්දෝරු ජේ. ආර්. ඒ. රුද්‍රිගෝ විසින් සාදන ලද අංක 4060 දරන පිඹුරේ නිරූපිත මෙම ඉඩමේ අංක 1 දරන කැබැල්ල, |
| නැගෙනහිරට | : | උඃරුතුඩාව සිට කුඩැල්ල දක්වා ඇති පාර ද, |
| දකුණට | : | මෙම ඉඩමේ අංක 7 දරන කැබැල්ල, |
| බස්නාහිරට | : | මෙම ඉඩමේ අංක 2 දරන කැබැල්ල ද, |

මායිම් වූ පර්චස් විස්සක් (පර්. 20) විශාල ඉඩම සහ එකී පිඹුරු අංක 920 ලොට් 7 න් නිරූපිත මාර්ග අයිතිය ද සමග,

මෙම ඉඩම හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍ර‍ඉරු D156/139, D237/39, J21/24 හි ලියාපදිංචි වී ඇත.

*ඉඩමට ගමන් මග.-* බණ්ඩාරගම නගරයේ සිට හොරණ පාර ඔස්සේ කි.මී. 3 රයිගම හන්දිය දක්වා පැමිණ, දකුණට ඇති අගුරුවාතොට පාරෙන් කි.මී. 8 කෙහෙල්හේනව දක්වා පැමිණ වම් පසින් හමුවන හොරණ පාරෙන් මීටර් 100 ක් ගොස් දකුණට ඇති කුඩැල්ල පතිරාජ මාවත හමුවේ. එම පාරෙන් මීටර් 500 ක් ගියපසු දකුණු පසට වන්නට මෙම දේපළ හමුවේ.

*ගෙවීම් ක්‍රමය :* වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.,

(1) සම්පූර්ණ මුදල ගෙවන්නේ නැතිනම් ගැණුම් මිලෙන් 25%,
(2) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තියේ (අ) යටතේ අයකිරීම් ද,

ගැණුම් මිලෙන් 75% ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත හොරණ දිසා අධිකරණයේ ඉහත නඩුවට බැර කළ යුතුය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාල සීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට පැමිණිලිකරුට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :

කළමණාකරු - දේපළ අංශය, සෙලාන් බැන්ක්, අංක 90, ගාලු පාර, කොළඹ 3.

011-2456485, 011-2456479, 011-2456473

පී. ආර්. ජයලත්ආරච්චි,
රෙජිස්ට්‍රාර්,
නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
හොරණ.

08-45

## බදුල්ල දිසා අධිකරණයේ දී ය

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 255 වන වගන්තියට අනුව පිස්කල් විසින් කරනු ලබන පිස්කල් විකිණීම

සෙලාන් බැන්ක් පීඑල්සී,
(කලින් සෙලාන් බැන්ක් ලිමිටඩ් යනුවෙන් හඳුන්වන ලද)
සෙලාන් ටවර්ස්, අංක 90, ගාලු පාර, කොළඹ 03.

*..............පැමිණිලිකරු.*

නඩු අංකය : MB/9582
ස්වභාවය : උකස්
වටිනාකම : රු. 1,432,515.96
ඇස්කිසි අංකය :

*එදිරිව*

දිසානායක මුදියන්සේලාගේ බුද්ධික බණ්ඩාර දිසානායක,
"සිසිල", බද්දේකුඹුර, ස්ප්‍රින් වැලි,
බදුල්ල.

*..................විත්තිකරු.*

බදුල්ල දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2020 ක් වූ අගෝස්තු මස 24 වැනි දින ලබාදෙන ලද ඒක පාක්ෂික නඩු තීන්දුව අනුව විත්තිකරු විසින් පැමිණිලිකාර බැංකුව වෙත ගෙවිය යුතු මුදල් පැහැර හැර ඇති බැවින් පැමිණිල්ලේ ආයාචනයේ අයැද ඇති පරිදි රුපියල් දාහතර ලක්ෂ තිස් දෙදහස් පන්සිය පහළොවයි ශත අනූ හයක (රු. 1,432,515.96) මුදල ද වර්ෂ 2019.06.21 දින සිට එකී මුදල පැමිණිලිකරු වෙත සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දින තෙක් රුපියල් දහතුන් ලක්ෂ තිස් දෙදහස් හයසිය අසූ නවයයි ශත හැට හතරක (රු. 1,332,689.64) මුදල මත 10.5% බැගින් වාර්ෂික පොළියක් ද ගෙවිය යුතු බවටද තවද අධිකරණයේ නිලධාරියකු විසින් තක්සේරු කරනු ලබන නඩු ගාස්තු ද අයකර ගැනීම සඳහා ද, ඉහත නම සඳහන් විත්තිකරුට අයත් දැනටමත් තහනමට ගෙන ඇති පහත උපලේඛනයේ සඳහන් වන දේපළ පිස්කල් වෙන්දේසියේ විකුණා පැමිණිලිකාර බැංකුවට අයකර දීම සඳහා,

**වර්ෂ 2024 ක් වූ සැප්තැම්බර් මස 05 වැනි දින පෙ. ව. 11.00 ට**

එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, යටිකිඳ කොට්ඨාසයේ, රිල්පොල කෝරළේ, බුලත්වත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, බැද්දේකුඹුර පිහිටි "දොඩම්ගස්වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එෆ්. ඉස්මයිල් විසින් වර්ෂ 1985 අගෝස්තු 25 වැනි දින මැන 1985 සැප්තැම්බර් මස 12 වැනි දින සාදන ලද අංක 2530 දරන පිඹුරේ හි නිරූපිත ලොට් 2 දරන බිම් කොටස සඳහා මායිම් :

උතුරට : ඩී. ජේ. වැලිකල සහ තවත් අයට අයත් ඉඩම ද,
නැගෙනහිරට : ස්ප්‍රින් වැලි ස්ටේට් ද,
දකුණට : බී. එල්. පී. අත්තනායකට අයත් ගෝනගස්වත්ත ද,
බස්නාහිරට : ඩී. එම්. අත්තනායකගේ ගෙවත්ත වෙන් වන අඩි පාර ද,

යන මායිම් තුළ පිහිටි පර්චස් විසි හතරයි දශම පහක් (පර්. 24.5) විශාල ඉඩම සහ ඒ තුළ ඇති ගහකොළ, වැවිලි ඇතුලු සියලු දේ ද සමග වේ.

මෙම ඉඩම බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිකාව B 245/74 හි ලියාපදිංචි වී ඇත.

ඉහත විස්තර කරනු ලබන ඉඩම නැවත මැන බලයලත් මිනින්දෝරු එච්. ඩබ්. එල්. අරුණකාන්ත විසින් මැන සාදන ලද අංක 607 සහ වර්ෂ 2014.01.12 දිනැති පහත සඳහන් පරිදි විස්තර වේ :

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රිල්පොල කෝරළේ, බුලත්වත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, බැද්දේකුඹුරගම පිහිටි (බලයලත් මිනින්දෝරු එම්. එෆ්. ඉස්මයිල් විසින් මැන සාදන ලද අංක 2530 සහ වර්ෂ 1985 අගෝස්තු 25 වැනි දිනැති පිඹුරෙහි නිරූපිත ලොට් 2 හි නැවත මැනීමකි) "දොඩම්ගස්වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඩබ්. එල්. අරුණකාන්ත විසින් මැන සාදන ලද අංක 607 සහ වර්ෂ 2014 ජනවාරි මස 12 දිනැති පිඹුරෙහි නිරූපිත ලොට් 1 දරන බිම් කොටස සඳහා මායිම් :

උතුරට : ඩී. ජේ. වැලිකල සහ තවත් අයට අයත් ඉඩම ද,
නැගෙනහිරට : පාර ද,
දකුණට : කාණුව සහ බී. එල්. පී. අත්තනායකට අයත් ඉඩම ද,
බස්නාහිරට : ඩබ්. ඒ. ජේ. පී. වීරසිංහට අයත් ඉඩම ද,

යන මායිම් තුළ පිහිටි පර්චස් විස්සයි දශම එකයි බිංදුවක් (පර්. 20.10) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි පහයි බිංදුවයි අටක් (හෙක්ටයාර් 0.0508) විශාල ඉඩම සහ ඒ තුළ ඇති ගහකොළ, වැවිලි ඇතුලු සියලු දේ ද සමග වේ.

මෙම ඉඩම බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව L 29/142 හි ලියාපදිංචි වී ඇත.

*දේපළට ගමන් මග.-* බදුල්ල නගරයේ සිට පස්සර පාරෙන් කි. මීටර් 1.9 ක් දුරින් දකුණු පසින් ඇති ස්ප්‍රින් වැලි පාර දක්වා පැමිණ, එම පාරෙන් කි. මීටර් 12 කණුව දක්වා පැමිණි පසු, තවත් මීටර් 75 ක් දකුණින් ඇති බික්කේතුඹුර පාර දක්වා පැමිණෙන්න. පසුව එම පාරෙන් මීටර් 300 ක් ගොස් දකුණට හැරී තවත් මීටර් 50 ක් ගියපසු වමට වන්නට මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීම් ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය :

(1) සම්පූර්ණ මුදල ගෙවන්නේ නැතිනම් ගැණුම් මිලෙන් 25% ක් ද,
(2) ප්‍රචාරණ වියදම් ද,
(3) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තියේ (අ) යටතේ අයකිරීම් ද,

ගැණුම් මිලෙන් 75% ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත බදුල්ල දිසා අධිකරණයේ ඉහත නඩුවට බැර කළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට පැමිණිලිකරුට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :

කළමණාකරු - දේපළ අංශය, සෙලාන් බැන්ක්, අංක 90, ගාලු පාර, කොළඹ 3.

011-2456485, 011-2456479, 011-2456473

පී. බී. සී. එම්. බොතේජු,
අධිකරණ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
ප්‍රොබේෂන් නිලධාරි/සාම විනිසුරු,
දිසා අධිකරණය,
බදුල්ල.

08-44

# නොතාරිස් ලැයිස්තුව

## නොතාරිස් ආඥාපනත (පත් කිරීම්)

නොතාරිස් ආඥාපනත 11 වන වගන්තිය යටතේ, ගරු රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා විසින් පහත සඳහන් පත්වීම් කර තිබේ :

(1) රඹුක්කන, දොඹේමඩ, කුඩාගම, "සුසිල් සෙවන" හි පදිංචි, උඩුමුල්ලේ අතුකෝරලගේ ජයමාලි කෞශල්‍යා අතුකෝරල මහත්මිය, කෑගල්ල අධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(2) පන්නිපිටිය, රුක්මල්ගම, අංක 9ඒ/163 හි පදිංචි, කළුතන්ත්‍රීගේ දොන් බුද්ධි සුරංජය කළුතන්ත්‍රී මහතා, කොළඹ අධිකරණ කලාපය තුළ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(3) කොළඹ 15, වෝල්ස් පටුමග, අංක 94/51 ඒ හි පදිංචි, අනිතා කනේසානන්දන් මෙනවිය, කොළඹ අධිකරණ කලාපය තුළ දෙමළ භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(4) පන්නිපිටිය, ඇරැව්වල, හේනවත්ත, අංක 542/2 සී හි පදිංචි, කනත්ත ගමගේ දොන් ඥානේන්ද්‍ර ප්‍රියදර්ශන මහතා, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(5) කොළඹ 12, බෙල්මන්ට් වීදිය, අංක 41/1 හි පදිංචි, මද්දුමාගේ ගීත් ක්‍රිෂාන්ත සේනාරත්න මහතා, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(6) ගනේමුල්ල, වැලිපිල්ලෑව, අංක 235 හි පදිංචි, යහලවෙල වහම්පුරගේ ප්‍රියන්ති බුද්ධිකා ප්‍රනාන්දු මහත්මිය, ගම්පහ අධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(7) මහනුවර, වටපුළුව, මහවැලි උයන, මෛත්‍රී මාවත, අංක 25 හි පදිංචි, කුසලා මනෝරංජනි කුමාරි විජේකෝන් මහත්මිය, මහනුවර අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්.

නීල් බණ්ඩාර හපුහින්න,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන
අමාත්‍යාංශය.

2023 ජනවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

08-20/1

---

## නොතාරිස් ආඥාපනත (පත් කිරීම්)

නොතාරිස් ආඥාපනත 11 වන වගන්තිය යටතේ, ගරු රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා විසින් පහත සඳහන් පත්වීම් කර තිබේ :

(1) පුඩුල්ඔය, පාසල වීදිය, අංක 6/5 හි පදිංචි, පෙරුමාල් ක්‍රිෂාන්දන් මහතා, නුවරඑළිය අධිකරණ කලාපය තුළ සිංහල, ඉංග්‍රීසි හා දෙමළ භාෂාවලින් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(2) හලාවත, කුරුණෑගල පාර, අංක 79 ජී හි පදිංචි, විජේසූරිය ආරච්චිගේ පමෝදා මධුෂාණි මෙනවිය, හලාවත අධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(3) හෙට්ටිපොල, ගැටගහට හන්දිය, "නුවන්" හි පදිංචි, නුවරපක්ෂ ජේඩිගේ දිල්හානි මහත්මිය, කුලියාපිටිය අධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(4) රත්නපුර, පරකඩුව, පත්බේරිය, රන්දිල්ගම, අංක 08හි පදිංචි, දස්කොන් මුදියන්සේලාගේ යුෂීඩා දිල්ශානි දස්කොන් මහත්මිය, රත්නපුර අධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(5) පිළියන්දල, මාම්පේ, ප්‍රබුද්ධ මාවත, අංක 128/4/සී/1හි පදිංචි, යෝගරාජාගේ ෂෙරීන් ෂොහානි මහත්මිය, හෝමාගම අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්.

නීල් බණ්ඩාර හපුහින්න,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2023 මාර්තු මස 03 වැනි දින,
කොළඹ දී ය.

08-20/2

---

## නොතාරිස් ආඥාපනත (පත් කිරීම්)

නොතාරිස් ආඥාපනත 11 වන වගන්තිය යටතේ, ගරු රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා විසින් පහත සඳහන් පත්වීම් කර තිබේ :

(1) කොළඹ 10, මාලිගාවත්ත, ජුම්මා මස්ජිත් පාර, අංක 168/28හි පදිංචි, බාලසුන්දරම් සිවසංකරී මෙනවිය, කොළඹ අධිකරණ කලාපය තුළ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(2) මහරගම, පමුණුව, දේවාල පාර, හෙන්රි පමුණුව මාවත, අංක 5/2 හි පදිංචි, ගීතා මධුශංකි ගමගේ මහත්මිය, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(3) කොළඹ 06, කිරුළපන, මහින්ද පෙදෙස, අංක 41 හි පදිංචි, දියගම රාළලාගේ චමෝදි හෂානි වාසනා ගුණතිලක මහත්මිය, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(4) කොළඹ 08, සරණපාල හිමි මාවත, අංක 175 හි පදිංචි, මල්වත්ත මොහොට්ටිලාගේ දුෂ්මන්ති මහත්මිය, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(5) කොළඹ 05, තිඹිරිගස්යාය පාර, අංක 69/1 හි පදිංචි, කංකානන් අච්චිගේ භාග්‍යා උදාරි රූපසිංහ මෙනවිය, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(6) ජා-ඇල, හෙට්ටිගම, ඉදිවිටිය පාර, අංක 37 ඒ හි පදිංචි, හංවාපොල අප්පුහාමිලාගේ හර්ෂණී ස්වර්ණලතා ප්‍රනාන්දු මහත්මිය, ගම්පහ අධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(7) මීගමුව, රේගුව පාර, අංක 21 හි පදිංචි, තලහිටිය විතානගේ වර්ණිකා දේශානි මහත්මිය, මීගමුව අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්.

නීල් බණ්ඩාර හපුහින්න,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2023 ජනවාරි මස 13 වැනි දින,
කොළඹ දී ය.

08-20/3

---

## නොතාරිස් ආඥාපනත (පත් කිරීම්)

නොතාරිස් ආඥාපනත 11 වන වගන්තිය යටතේ, ගරු රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා විසින් පහත සඳහන් පත්වීම් කර තිබේ :

(1) කඩුවෙල, කොතලාවල, පට්ටියවත්ත පාර, අංක 180/ඒ/01හි පදිංචි, හිඟුර ගමගේ සුරේෂ් සාලින්ද අමරසිංහ මහතා, හෝමාගම අධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(2) බූස්ස, දැල්කඩ, වාඩියවත්ත හි පදිංචි, සමරප්පුලිගේ ශාලිකා මධුෂානි කුමාරි මහත්මිය, ගාල්ල අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(3) මාතර, හිත්තැටිය මැද, කොස්ගොඩරුප්ප, අංක 33/15 ඒ හි පදිංචි, හේවා කංකානම්ගේ චතුරි ලසන්ති මහත්මිය, මාතර අධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(4) බොරලැස්ගමුව, කැස්බෑව පාර, අංක 200/2 හි පදිංචි, චිත්මිණි විලෝක්‍යා ලියනවත්ත මහත්මිය, කොළඹ අධිකරණ කලාපය තුළ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(5) කොළඹ 05, අන්දරවත්ත පාර, අංක 29 හි පදිංචි, අබේසිංහ මොහොට්ටාලලාගේ කල්පනා රංගනී අබේසිංහ මහත්මිය, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(6) රාජගිරිය, කලපලුවාව, බුත්ගමුව පාර, අංක 1 ඒ හි පදිංචි, සන්ධ්‍යා කුමාරි ජයවර්ධන මෙනවිය, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්.

නීල් බණ්ඩාර හපුහින්න,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2023 ජනවාරි මස 23 වැනි දින,
කොළඹ දී ය.

08-20/04

---

## නොතාරිස් ආඥාපනත (පත් කිරීම්)

නොතාරිස් ආඥාපනත 11 වන වගන්තිය යටතේ, ගරු රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා විසින් පහත සඳහන් පත්වීම් කර තිබේ :

(1) සිද්ධමුල්ල, යෝධ මාවත, ඉසුරු උයන, අංක 28/ඒ හි පදිංචි, කංකානමලාගේ කුමුදු කුමාරි ධනපාල මහත්මිය, හෝමාගම අධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(2) මහරගම, නාවින්න, හයිලෙවල් පාර, අංක 310 හි පදිංචි, පොතුපිටියගේ දෝන දසුනි තත්සරා වීරසිංහ මෙනවිය, කොළඹ අධිකරණ කලාපය තුළ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(3) මොරටුව, කටුබැද්ද, 1 වන පටුමග, අංක 54/7 හි පදිංචි, හෙට්ටි ආරච්චිගේ ලක්ෂ්මන් ලීලානන්ද විජේසිංහ මහතා, පානදුර අධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(4) නුගේගොඩ, උඩහමුල්ල, ජය පාර, අංක 92/18 හි පදිංචි, දෙනුවර සමරසිංහ දිලූෂ විමර්ෂණ මහතා, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(5) නක්කාවත්ත, බිහල්පොළ, රජයේ රෝහල අසල, අංක 427/1 හි පදිංචි, වික්‍රමසේකර මුදියන්සේලාගේ චලනි නිසංසලා ප්‍රියමාලි මහත්මිය, කුලියාපිටිය අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(6) හක්මන, කරතොට, කජ්ජුකොරටුව, අංක 33 හි පදිංචි, සභාපති රංහොට් ගමගේ උදාරි පියභාෂිනි මෙනවිය, මාතර අධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්.

නීල් බණ්ඩාර හපුහින්න,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2023 ජනවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

08-20/5

## නොතාරිස් ආඥාපනත (පත් කිරීම්)

නොතාරිස් ආඥාපනත 11 වන වගන්තිය යටතේ, ගරු රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා විසින් පහත සඳහන් පත්වීම් කර තිබේ :

(1) මීගමුව, රේගුව පාර, අංක 21 හි පදිංචි, කොරුවාගේ සුනෙත් මලින්ද ප්‍රනාන්දු මහතා, මීගමුව අධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(2) අවුලේගම, ඇතව, තණහේන වත්ත හි පදිංචි, රාජපක්ෂ ගෙදර මංගලිකා ප්‍රියදර්ශනී මහත්මිය, කුරුණෑගල අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(3) කොළඹ 05, නාරාහේන්පිට, කිරුල පාර, අංක 225/5 හි පදිංචි, හබරකඩ ලියනගේ නුවන්ති අමරසේන මහත්මිය, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(4) ඇතුල් කෝට්ටේ, කොළඹතන්ත්‍රී මාවත, 4-1, අංක 18, රූ රෙසිඩන්සිස් හි පදිංචි, කෞශල්‍යා යසෝධරා සෙන්දනායක ආරච්චි මෙනවිය, කොළඹ අධිකරණ කලාපය තුළ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(5) නුවරඑළිය, ක්‍රේට්න් විලේජ්, අංක 60 හි පදිංචි, කණුමුල්දෙණිය සුරන්දි උදේශිකා රත්නායක මහත්මිය, නුවරඑළිය අධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(6) දෙවලපල, ගල්ලේගෙදර, අංක 110/2 හි පදිංචි, තෙන්නකෝන් මුදියන්සේලාගේ තැන්නේගෙදර අයේෂා එරන්දි කරුණාරත්න මහත්මිය, ගම්පහ අධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

නීල් බණ්ඩාර හපුහින්න,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2023 ජනවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

08-20/6

## නොතාරිස් ආඥාපනත (පත් කිරීම්)

නොතාරිස් ආඥාපනත 11 වන වගන්තිය යටතේ, ගරු රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා විසින් පහත සඳහන් පත්වීම් කර තිබේ :

(1) බදුල්ල, පහළ වීදිය, අංක 169 හි පදිංචි, නඩරාජා ප්‍රියදර්ෂිනි මෙනවිය, බදුල්ල අධිකරණ කලාපය තුළ දෙමළ භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්.

කේ. ඩී. එන්. රංජිත් අසෝක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2023 අප්‍රේල් මස 26 වැනි දින,
කොළඹ දී ය.

08-20/7

## නොතාරිස් ආඥාපනත (පත් කිරීම්)

නොතාරිස් ආඥාපනත 11 වන වගන්තිය යටතේ, ගරු රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා විසින් පහත සඳහන් පත්වීම් කර තිබේ :

(1) නුගේගොඩ, ගංගොඩවිල, විජේරාම පළමු පටුමග, අංක 46 හි පදිංචි, නායක බණ්ඩාරලාගේ මධුෂාණි මහේෂිකා මුතුකුමාරි මෙනවිය, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(2) කොළඹ 12, වේල්ල වීදිය, අංක 391/ඒ 4 හි පදිංචි, මොහොට්ටි ආරච්චිලාගේ මදූෂිකා රාමනායක මෙනවිය, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(3) තිඹිරිගස්කටුව, උතුරු කදිරාන, බෙස්ලයින් පාර, අංක 129/1 හි පදිංචි, විෂ්ණු ලාවන්‍යා මහත්මිය, මීගමුව අධිකරණ කලාපය තුළ ඉංග්‍රීසි හා දෙමළ භාෂාවලින් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(4) දෙනිපිටිය, පොල්වත්ත, ලිඳවත්ත හි පදිංචි, ඉසුරු සාරංග වාදසිංහ මහතා, මාතර අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(5) මහරගම, දුම්රියපොළ පාර, අංක 39/1 හි පදිංචි, සිජිත් තිවංක මුණසිංහ මහතා, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(6) මීගමුව හරහා, කටුවැල්ලේගම, අංක 253 හි පදිංචි, හෙයියන්තුඩු පතිරන්නැහැලාගේ චාරුණි චේතනා හෙයියන්තුඩුව මහත්මිය, මීගමුව අධිකරණ කලාපය තුළ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(7) ජා-ඇල, තුඩැල්ල, ක්‍රිස්තුරාජ මාවත, අංක 32/3 හි පදිංචි, වදුරුවලගේ වාසනා දීප්ති ප්‍රනාන්දු මහත්මිය, මීගමුව අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(8) කොළඹ 15, මට්ටක්කුලිය, කාක දූපත, අංක 65/52 හි පදිංචි, දිසානායක මුදියන්සේලාගේ නදීෂා මධුෂානි දිසානායක මහත්මිය, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(9) කොළඹ 05, හැව්ලොක් පාර, අංක 194 හි පදිංචි, මතෙස් හේවගේ වාසනා මධුෂාණි මෙනවිය, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්.

කේ. ඩී. එන්. රංජිත් අසෝක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2023 අප්‍රේල් මස 23 වැනි දින,
කොළඹ දී ය.

08-20/8

---

**නොතාරිස් ආඥාපනත (පත් කිරීම්)**

නොතාරිස් ආඥාපනත 11 වන වගන්තිය යටතේ, ගරු රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා විසින් පහත සඳහන් පත්වීම් කර තිබේ :

(1) අතුරුගිරිය, බක්මීගහ පාර, අංක 151/1 බී හි පදිංචි, මුතුකුඩ විජේසූරිය ආරච්චිලාගේ සුරේනි අනුරාධා විජේසූරිය මහත්මිය, හෝමාගම අධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(2) ඇඹිලිපිටිය, කිරලවැල්කටුව, "සම්මානි" හි පදිංචි, පාඬිප්පෙරුම ආරච්චිගේ අයේෂා ප්‍රසාදි මෙනවිය, ඇඹිලිපිටිය අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(3) මත්තේගොඩ, නිවාස සංකීර්ණය, අංක 1එෆ්/23 හි පදිංචි, යමුනා කුමාරි රණවීර ජයවර්ධන මහත්මිය, හෝමාගම අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(4) යක්කල, ගම්පහ පාර, විජිත මාවත, අංක 67/30 හි පදිංචි, මදූෂා ලක්මාලි දිසානායක මහත්මිය, ගම්පහ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(5) මහියංගණය, අලුත්තරම, විරාණගම, 10 කණුව, අංක 20 හි පදිංචි, අමරසිංහ ආරච්චිගේ තරංගා මධුෂානි මහත්මිය, බදුල්ල අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(6) කඳාන, ආනියාකන්ද, සෙන්ට්‍රල් පාර්ක්, අංක 54/16 හි පදිංචි, උඩවත්ත ආරච්චිගේ ඉසුරු දෙනුවන් සඳමාල් පෙරේරා මහතා, ගම්පහ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(7) අත්තිඩිය, මන්ත්‍රීමුල්ල පාර, අංක 34/26 ඒ හි පදිංචි, චතුසලා දිනූෂානි ජයසිංහ මහත්මිය, කොළඹ අධිකරණ කලාපය තුළ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(8) පුත්තලම, තිල්ලයඩි, දෙවන හරස් පාර, අංක 40 හි පදිංචි, කලීදුල්ලාහ් මිෆ්ලිහා මහත්මිය, පුත්තලම අධිකරණ කලාපය තුළ ඉංග්‍රීසි හා දෙමළ භාෂාවලින් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්.

නීල් බණ්ඩාර හපුහින්න,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2023 පෙබරවාරි මස 02 වැනි දින,
කොළඹ දී ය.

08-20/9

### නොතාරිස් ආඥාපනත (පත් කිරීම්)

නොතාරිස් ආඥාපනත 11 වන වගන්තිය යටතේ, ගරු රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා විසින් පහත සඳහන් පත්වීම් කර තිබේ :

(1) පොළොන්නරුව, නව නගරය, රජයේ නිවාස යෝජනා ක්‍රමය, අංක 438 හි පදිංචි, කාංචනා මධුෂාණි ලියනගේ මහත්මිය, පොළොන්නරුව අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

නීල් බණ්ඩාර හපුහින්න,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2023 මාර්තු මස 13 වැනි දින,
කොළඹ දී ය.

08-20/10

---

### නොතාරිස් ආඥාපනත (පත් කිරීම්)

නොතාරිස් ආඥාපනත 11 වන වගන්තිය යටතේ, ගරු රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා විසින් පහත සඳහන් පත්වීම් කර තිබේ :

(1) පිළියන්දල, මඩපාත, කොටගෙදර පාර, සපුමල් උයන, අංක 203/එල් හි පදිංචි දසනායක මුදියන්සේලාගේ කාලංසි ගෙදර මනෝජා ස්වර්ණමාලි දසනායක මහත්මිය, හෝමාගම අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(2) බදුල්ල, වියදිගුණ, සායන මධ්‍යස්ථානය ඉදිරිපිට, අංක 100/2 හි පදිංචි කෝන්ගල ගමගේ දුලන්දිකා සෙව්වන්දි මහත්මිය, බදුල්ල අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

